# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2019 අගෝස්තු මස 02 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2019.08.05 දින නිකුත් කරන ලදී)**


## ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව

**රුහුණු සංවර්ධන ප්‍රදේශය තුළ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම හඳුනා ගැනීමේ, සකස් කිරීමේ හා සම්බන්ධීකරණය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 40.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව

එල්. ඩී.— ඕ. 63/2018

**රුහුණු සංවර්ධන ප්‍රදේශය තුළ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හඳුනා ගැනීමේ, සකස් කිරීමේ හා සම්බන්ධීකරණය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික සංවර්ධනයක් සුරක්ෂිත කිරීම සඳහා නිශ්චිත වශයෙන් වෙළෙඳාම, අපනයන, තාක්ෂණය, සංචාරක ව්‍යාපාරය සහ නවීන කෘෂිකාර්මික රැකියා අවස්ථාවන්හි වේගවත් ආර්ථික සංවර්ධනයක් දිරිමත් කිරීම සඳහා රුහුණු ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම අවශ්‍ය වී ඇති හෙයින් ද;

ආර්ථික සංවර්ධනය අභිවර්ධනය කිරීමේ කාර්යය සඳහා සංස්ථාවක් පිහිටුවීම ජාතික වැදගත්කමින් යුත් කරුණක් බවට පත් වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2019 අංක දරන ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව පිහිටුවීම

ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව පිහිටුවීම.

**2.** (1) (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රුහුණු ආර්ථික සංවර්ධන සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු සංස්ථාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන්, එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

3. සංස්ථාවේ පරමාර්ථ පහත පරිදි විය යුතු ය:- සංස්ථාවේ පරමාර්ථ

(අ) 18 වන වගන්තිය යටතේ සකස් කරන ලද ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රදේශය තුළ ජාත්‍යන්තර වශයෙන් ඉලක්ක කරගත් තරගකාරී වෙළෙඳපොළ පදනම් කරගත් සහ වේගවත් තිරසාර ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(ආ) වරාය සහ ගුවන් තොටුපොළ සමඟ උපායමාර්ගික සැපයුම් ප්‍රවර්ධන සංධිස්ථානයක් සංවර්ධනය කිරීම;

(ඇ) ආර්ථික සංවර්ධන කලාප පිහිටුවීම සහ නම් කිරීම;සහ

(ඈ) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාපවල දේශීය හා විදේශීය ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පහත පරිදි විය යුතු ය:- සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය.

(අ) 18 වන වගන්ති යටතේ සකස් කරන ලද ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම ක්‍රියාවේ යොදවමින් ශ්‍රී ලංකාවේ ආර්ථික පදනම දිරිමත් කිරීම, ව්‍යාප්ත කිරීම, සංවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම;

(ආ) 18 වන වගන්තිය යටතේ සකස් කරන ලද යම් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම මගින් නියමිත මාර්ග, ජල සැපයුම, නිවාස සහ එවැනි වෙනත් පහසුකම් ඇතුළත් යටිතල පහසුකම් නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප සඳහා සැපයීම;

(ඇ) ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයන සිදුකිරීම සහ ප්‍රමුඛතා පදනම මත නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප සඳහා සමස්ත සංවර්ධන සැලැස්මේ පවතින ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම හඳුනාගැනීම;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ඉ) ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනාක්‍රම පිළිබඳ අධ්‍යයන සිදුකිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම පළාත් සභාවකම, පළාත් අමාත්‍යාංශයකම සහ දෙපාර්තමේන්තුවකම සහ පළාත් පාලන ආයතනයකම සහ පෞද්ගලික හෝ රජයේ වෙනත් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩලයක අන්තර් නියෝජිත ආයතන අතර සහයෝගීතාව ඇති කිරීම සහ වැඩිදියුණු කිරීම;

(ඊ) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප තුළ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම;

(උ) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප තුළ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම පිළිබඳව සවිස්තරාත්මක අධ්‍යයන සිදුකිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී දේශීය සහ විදේශීය පෞද්ගලික අංශ නියෝජිත ආයතනයන්හි සහභාගීත්වය තහවුරු කිරීම;

(ඌ) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප පරිපාලනය කිරීම;

(එ) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාපවලින් පිටත යම් කාර්යාලයක් හෝ ගබඩා පවත්වාගෙන යාම සහ අවශ්‍ය විය හැකි එවැනි යම් කාර්යයක් එසේ නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාපවලින් පිටත දී ඉටුකිරීම;

(ඒ) සංස්ථාව විසින් භාරගනු ලබන වැඩකටයුතු පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම;

(ඔ) තාක්ෂණික සහ මූල්‍ය සහාය සුරක්ෂිත කිරීම සහ ලබා ගැනීම;

(ඕ) ප්‍රදේශය තුළ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ විදේශීය සහයෝගීතාව සුරක්ෂිත කිරීම; සහ

(ක) යම් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම පවරා ගැනීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, පළාත්සභාව, පළාත් අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතන සහ වෙනත් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩලයක් වෙත ඉල්ලා සිටීම;

(ග) සංස්ථාවට අවශ්‍ය විය හැකි අංශ පිහිටුවීම;

(ච) ප්‍රදේශයේ ආර්ථික සහ සාමාජීය සංවර්ධනයට අදාළ පර්යේෂණ සිදුකිරීම;

(ජ) ප්‍රදේශය තුළ යම් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩ සටහන් හෝ යෝජනාක්‍රම සම්බන්ධයෙන් පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තාවක් සකස් කිරීමට කටයුතු කිරීම;

(ට) අවසර පත්‍ර, අනුමතීන්, බලපත්‍ර සහ පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන්නා වූ සියලු නිෂ්කාශන සඳහා අවශ්‍ය පහසුකම් සඳහා සංවර්ධනය කරන්නන්ගේ සහ ව්‍යවසායකයන්ගේ ඉල්ලීම් යොමුකිරීමට තනි නැවතුම් ඒකකයක් පිහිටුවීම මගින් කලාපයක් තුළ නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කරන්නන් සහ ව්‍යවසායකයන් සඳහා පහසුකම් සැලසීමට සහාය ලබාදීම;

(ඩ) ප්‍රදේශය තුළ තනි පුද්ගල ව්‍යවසායන් ඇතුළු නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප නම් කිරීමේ, අනුමත කිරීමේ, පිහිටුවීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ විධිමත් කිරීමේ සියලු අංග පිළිබඳ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ණ) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප තුළ රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම මගින් දේශීය සහ විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම;

(ත) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාපය සංවර්ධනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා හෝ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් යම් කාර්යයක් සඳහා පිහිටුවනු ලබන රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර අස්ථිත්‍යයක කොටස් දැරීම;

(ද) නම් කරන ලද ආර්ථික සංවර්ධන කලාප තුළ සංස්ථාව විසින් සලසන ලද සේවා සඳහා ගාස්තුවක් පැනවීම හෝ අයකර ගැනීම;

(න) ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියක්, සැලසුම්, වැඩසටහනක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නැංවීමේ දී සංස්ථාව විසින් යම් තැනැත්තකුට සපයනු ලබන යම් මූල්‍ය ආධාරයක් උපයෝගී කරගන්නා බවට වගබලා ගැනීම;

(ප) යම් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ යම් කාර්යාල, යන්ත්‍රාගාර. යන්ත්‍රෝපකරණ හෝ වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීම, අත්කර ගැනීම, ඉදිකිරීම, පවත්වාගෙන යාම, නැවත ඉදිකිරීම හෝ යොදා ගැනීම;

(බ) යම් නිශ්චල දේපළක් කවර හෝ යම් ආකාරයකින් අත්කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ලබාගැනීම හෝ ලබාදීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම; සහ

(ම) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සුදුසු හෝ ආනුෂංගික විය හැකි එවැනි වෙනත් ක්‍රියා සිදු කිරීම.

## II වන කොටස

### සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

සංස්ථාව පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරිය යුතු ය.

(2) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් මේ පනත මගින් සංස්ථාව වෙත භාරදෙන ලද හෝ පවරන ලද හෝ පනවන ලද බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම සිදු කළ යුතු ය.

**6.** මණ්ඩලය- මණ්ඩලයේ සංයුතිය.

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වූ සාමාජිකයන්ගෙන්, එනම්-

(i) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම් ධුරයට අඩු නොවන ධුරයක් දරන්නා වූ නිලධරයකු වන ඔහුගේ යම් නියෝජිතයකු;

(ii) දක්ෂිණ සංවර්ධන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම් ධුරයට අඩු නොවන ධුරයක් දරන්නා වූ නිලධරයකු වන ඔහුගේ යම් නියෝජිතයකු; සහ

(iii) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා හෝ ඉහත පනතේ 5(1) (අ) වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂවරයන් අතරින් ඔහු විසින් නම් කරනු ලබන යම් අධ්‍යක්ෂවරයකු; සහ

(iv) 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල නීතියේ 6 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා;

(ආ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ආර්ථික විද්‍යාව, මුදල්, කළමනාකරණය, පරිපාලනය හෝ නීතිය යන ක්ෂේත්‍රයන්හි අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දක් සහිත, අමාත්‍යවරයා විසින් පත්කරන ලද වෙනත් සාමාජිකයන් සිව් දෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

7. (1) අමාත්‍යවරයා විසින්, පත් කළ සාමාජිකයන් අතරින් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

(2)අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් එය පිළිගනු ලබන දිනයේ සිට බලාත්මක වන්නේ ය.

(3)අමාත්‍යවරයා විසින් සභාපතිවරයා හේතු දක්වා සභාපති ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානයන්ට යටත් ව සභාපතිවරයාගේ ධුර කාලය, මණ්ඩලයේ ඔහු සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(5 රෝගාතුරවීම, වෙනත් අශක්නුතාවකට පත්වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකිවන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, වෙනත් යම් පත් කළ සාමාජිකයකු ඔහුගේ සාමාන්‍ය කාර්යයන්ට අමතරව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුස්සකු වීමට හේතු.

8. යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින නීතිය යටතේ, සිහිවිකල තැනැත්තකු බවට අනාවරණය වූ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ බලාත්මක යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් වූවකු හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබ සහ නිදහස්කරනු නොලැබූ වස්තුභංගත්වයට පත් වූවකු හෝ බංකොලොත් වූවකු වන තැනැත්තකු වන්නේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද යම් බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තකු වන්නේ නම්;

(ඊ) සංස්ථාව මගින් හෝ සංස්ථාව වෙනුවෙන් ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් දරන හෝ භුක්ති විඳින තැනැත්තෙක් වන්නේ නම්; හෝ

(උ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍ය ඔහු විසින් ඉටුකිරීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවක් ඇති තැනැත්තෙක් වන්නේ නම්, එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් අඛණ්ඩ කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**9.** සෑම පත්කළ සාමාජිකයකු ම ඉල්ලා අස්වීමෙන්, මිය යාමෙන් හෝ ඉවත් කිරීමෙන් ස්වකීය ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත්කළ දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඉවත් කරන ලද සාමාජිකයකු හැරුණුකොට එකී සාමාජිකයා නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

**10.** (1) සෑම පත්කළ සාමාජිකයකුට ම, තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම අවස්ථාවක දී, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(2) යම් පත්කළ සාමාජිකයකු රෝගාතුර වීම, අශක්නුතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටුකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) යම් පත්කළ සාමාජිකයකු මිය යාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත්කළ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි ව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

මණ්ඩලයේ ගණපූරණය සහ රැස්වීම්.

11. (1) මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින් මසකට එක් වතාවක් පවත්වනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකු විය යුතු ය.

(2) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තෝරා පත්කර ගත් සාමාජිකයකු එකී රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, එකී රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතර ව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානයන්ට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව.

12. මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතියද එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත්කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් අවලංගු නොවිය යුතු අතර, අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

13. මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණ මත සංස්ථාවේ අරමුදලෙන් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**14.** (1) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලයේ අවසරය සහිතව සහ මණ්ඩලයේ සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිඳු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ ඔවුන් තම නම අත්සන් කළ යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට සංස්ථාවේ මුද්‍රාව තබන අවස්ථාවක දී සභාපතිවරයාට පැමිණීමට නොහැකි විට මේ උපවගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානයන්ට අනුකූලව එකී සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කිරීමට තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව අවසර ලබාදෙන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු ඒ සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(4) සංස්ථාව විසින්, සංස්ථාවේ මුද්‍රාව යොදා ඇති සාධන පත්‍ර හා ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

## III වන කොටස

## රුහුණු සංවර්ධන ප්‍රදේශය

ප්‍රදේශය තුළ රුහුණු ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය.

**15.** ප්‍රදේශය තුළ රුහුණු ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය විසින් වෙනත්දෑ අතරින්-

(අ) ජාත්‍යන්තර ගුවන් මුහුදු සැපයුම් ප්‍රවර්ධන සංධිස්ථානයක් හම්බන්තොට සංවර්ධනය කිරීම;

(ආ) ප්‍රදේශය ඇතුළත ගෝලීය වශයෙන් තරගකාරී ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව තුළ පවතින කර්මාන්ත හා සේවා පසු සම්බන්ධතාවයන් වැඩි කිරීම;

(ඈ) ආර්ථික වර්ධනය සඳහා වන උත්ප්‍රේරකයක් වශයෙන් ආර්ථික සංවර්ධන කලාප පිහිටුවීම සහ නම් කිරීම;

(ඉ) රැකියා නිර්මාණය කිරීම; සහ

(ඊ) පුහුණු ශ්‍රම බලකායක් වර්ධනය කිරීම, යනාදිය මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථික පදනම ශක්තිමත් කළ යුතු ය.

රුහුණු ආර්ථික සංවර්ධන ප්‍රදේශය.

**16.** (1) රුහුණු ආර්ථික සංවර්ධන ප්‍රදේශය (මෙම පනතේ "ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) හම්බන්තොට, මොණරාගල, මාතර සහ ගාල්ල යන පරිපාලන දිස්ත්‍රික්කවලින් සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් ප්‍රදේශය තුළ ඇති යම් භූමි ප්‍රදේශයක් ආර්ථික සංවර්ධන කලාපයක් වශයෙන් පිහිටුවා නම් කරනු ලැබිය හැකි අතර එම දැන්වීමෙහි එවැනි එක් එක් කලාපය තුළට වැටෙන භූමි ප්‍රදේශයේ ඉම් හා මායිම් නිශ්චිතව දැක්විය යුතු ය. එවැනි භූමි ප්‍රදේශයක් සංස්ථාව සතු විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ එවැනි දැන්වීමක් පළ කිරීමෙන් පසුව, මේ පනතේ විධිවිධානවලට අනුකූලව එසේ නම් කළ ආර්ථික සංවර්ධන කලාපය පිහිටුවීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් සංස්ථාව වගකිව යුතු ය.

(4) නම් කළ ආර්ථික සංවර්ධන කලාපය තුළ යම් භූමියක් සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්යය සඳහා සහ මේ පනතේ 18 වන වගන්තිය යටතේ සාදන ලද යම් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රමවලට අනුකූලව යම් තැනැත්තකුට හෝ සංස්ථාපිත මණ්ඩලයකට පවරා දීම හෝ බදු දීම සිදු කරනු ලැබිය හැකි ය.

(5) යම් ලිඛිත නීතියකට යටත් ව, එවැනි නම් කළ ආර්ථික සංවර්ධන කලාපයක මායිම් රේඛාව දක්වා සුදුසු යටිතල පහසුකම් සංවර්ධනය, මෙහෙයවීම සහ නඩත්තු කිරීම සහ ඒ සඳහා මූල්‍ය සහාය ලබාදීම සංස්ථාව විසින් භාරගැනීම හෝ අනුමත කිරීම කරනු ලැබිය හැකි ය.

(6) ආර්ථික සංවර්ධන කලාපය තනි ආංශික කලාපයක් ලෙස හෝ බහු ආංශික කලාපයක් ලෙස නම් කරනු ලැබිය හැකි අතර-

(අ) කර්මාන්ත;

(ආ) උද්‍යාන;

(ඇ) තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යවසායයන්;

(ඈ) විද්‍යා හා තාක්ෂණ ව්‍යවසායයන්;

(ඉ) උසස් තාක්ෂණ කෘෂිකාර්මික ව්‍යවසායයන්;

(ඊ) සංචාරක සහ විනෝදාත්මක ව්‍යවසායයන්;

(උ) ව්‍යාපාර සේවා ව්‍යවසායයන්; හෝ

(ඌ) පශු සම්පත් ව්‍යවසායයන්,

ඇතුළත් ව එහෙත් ඊටම සීමා නොවූ ලෙස පැවතිය හැකි ය.

(7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ යම් ලිඛිත නීතියකට යටත්ව, අමාත්‍යවරයා විසින් යම් රජයේ භූමියක් නම් කළ ආර්ථික සංවර්ධන කලාපයක් වශයෙන් ප්‍රකාශයට පත්කර නම් කරනු ලැබිය හැකි ය. නම් කළ ආර්ථික සංවර්ධන කලාපය තුළ පිහිටි යම් රජයේ භූමියක් නම් කළ ආර්ථික සංවර්ධන කලාපය තුළ ඇති සංවර්ධනය කරන්නන්, මෙහෙයවන්නන් හෝ ව්‍යවසායයන් හෝ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් වෙත හැර පෞද්ගලික භාවිතය සඳහා පවරා දෙනු නොලැබිය යුතු ය.

ආර්ථික සංවර්ධන කලාපයේ කටයුතු කිරීම සඳහා බල පත්‍රය.

**17.** වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, කිසිදු තැනැත්තකු විසින්, මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව සංස්ථාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරය යටතේ හැර යම් නම් කළ ආර්ථික සංවර්ධන කලාපයක් තුළ ක්‍රියාකාරකම් හෝ පහසුකම් සැපයීම හෝ නඩත්තු කිරීම හෝ ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කරන්නකු වශයෙන් හෝ මෙහෙයුම් කටයුතු සිදුකරන්නකු වශයෙන් හෝ ව්‍යවසායයක් වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සිදු නොකළ යුතු ය.

ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම සකස් කිරීම.

**18.** (1) අමාත්‍යවරයා විසින් රුහුණු ආර්ථික සංවර්ධනය පිළිබඳ වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන්නා වූ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම සකස් කිරීම සඳහා කටයුතු සැලැස්විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කළ හැකි ය.

## IV වන කොටස

### සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය

සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා පත් කිරීම.

**19.** (1) මණ්ඩලය විසින් අමාත්‍යවරයා විමසා සහ (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කරන ලද සුදුසුකම් සහ බඳවාගැනීමේ පටිපාටිය සැලකිල්ලට ගනිමින් (මේ පනතේ "ප්‍රධාන විධායක නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවේ කාර්ය මණ්ඩලයට ප්‍රධාන විධායක නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟතාවය ඇති ව ප්‍රධාන විධායක නිලධාරි ධුරය සඳහා සුදුසුකම් සහ බඳවාගැනීමේ පටිපාටිය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන විධායක නිලධරයා විසින් මණ්ඩලයේ සාමාන්‍ය විධානයන්ට සහ අධීක්ෂණයට යටත්ව-

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළුව සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම භාරව ක්‍රියා කළ යුතු ය;

(ආ) මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) මණ්ඩලය විසින් ඔහුට පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍ය සිදුකළ යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධරයාට මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගීවීමට සහ එහි දී කතාකිරීමට හිමිකම් තිබිය යුතු නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(5) ප්‍රධාන විධායක නිලධරයා විසින්, මණ්ඩලයේ අනුමතය ඇතිව ඔහුගේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් සංස්ථාවේ යම් නිලධරයකුට ලිඛිතව පැවරීම කරනු ලැබිය හැකි අතර, එම බලතල හෝ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද ඒ නිලධරයා විසින් එම බලතල හෝ කර්තව්‍ය ප්‍රධාන විධායක නිලධරයාගේ විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(6) මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධරයා-

(අ) ඔහුට අයත් කාර්යයන් කිරීමට ස්ථිරව අපොහොසත් තත්ත්වයට පත්ව ඇත්නම්;

(ආ) මණ්ඩලයේ මතය අනුව යම් වංචාකාරී හෝ නීති විරෝධී ස්වභාවයෙන් යුතු ක්‍රියාවක් හෝ මණ්ඩලයේ සම්බන්ධතාවලට අගතියක් වන ක්‍රියාවක් ඔහු විසින් සිදුකර ඇත්නම්; හෝ

(ඇ) මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇත්නම්,

ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

**සංස්ථාවේ කාර්ය මණ්ඩලය.**

**20.** (1) මේ පනතේ විධිවිධානයන්ට යටත්ව, සංස්ථාවේ බලතල සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය විය හැකි යම් සේවා නියුක්තිකයන් පත් කිරීම සංස්ථාව විසින් සිදු කරනු ලැබිය හැකි ය.

(2) පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයට-

(අ) සංස්ථාවේ සේවා නියුක්තිකයන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සහ ඔවුන් සේවයෙන් පහකිරීමට;

(ආ) සංස්ථාවේ සේවා නියුක්තිකයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීමට; සහ

(ඇ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව එම සේවා නියුක්තිකයන්ට ගෙවනු ලැබිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණයන් නියම කිරීමට,

බලය තිබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලු සේවා නියුක්තිකයන් විසින්, සේවා නියුක්තියෙන් එක් මසක් ඇතුළත, ඔවුන්ගේ සමීප ඥාතීන්ගේ සම්බන්ධතා ඇතුළුව සංස්ථාවේ කටයුතු සහ ගනුදෙනු සම්බන්ධයෙන් වන ඔවුන්ගේ ඍජු හෝ වක්‍ර පෞද්ගලික සම්බන්ධතා හෝ එකී සේවා නියුක්තිකයාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති කරුණු සම්බන්ධයෙන් ලිඛිතව සංස්ථාවට ප්‍රකාශ කළ යුතු ය.

**සංස්ථාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.**

**21.** (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබ ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් ගිවිසුමක් යටතේ නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින්, සේවයේ නියුක්ත කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම තැනැත්තා විසින් සංස්ථාවට සේවය කරනු ලබන යම් කාලයක් එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සේවය කරනු ලබන කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පරිදි පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, එම සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ එම පළාත් පාලන ආයතනය එකඟ වන නියම හා කොන්දේසි මත, ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, එම කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම, එම තැනැත්තා යටත් විය යුතු ය.

රාජ්‍ය සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

**22.** (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, එම නිලධරයාගේ හෝ සේවකයාගේ සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇති ව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇති ව විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළු මණ්ඩලය සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වන වෙනත් නියම සහ කොන්දේසි මත, එම නිලධරයා හෝ සේවකයා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උප වගන්තිය යටතේ යම් තැනැත්තකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, එම කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම එම තැනැත්තා යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධ "පාලක මණ්ඩලය" යන්නෙන්, එම රාජ්‍ය සංස්ථාවේ පරිපාලනය හා කළමනාකරණය පැවරී ඇති අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ.

## V වන කොටස

### අරමුදල

සංස්ථාවේ අරමුදල.

**23.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදලට පහත දැක්වෙන අරමුදල් බැර කරනු ලැබිය යුතු ය:—

(අ) සංස්ථාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ණය මුදල්, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල්; සහ

(ඇ) සංස්ථාව විසින් ලබාදෙනු ලබන සේවා සඳහා සංස්ථාවට ලැබෙන සියලු මුදල්.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව විසින්

දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අරමුදල් වෙන් කිරීම.

**24.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට සහ යම් ලිඛිත නීතියකට යටත්ව සංස්ථාව විසින් ස්වකීය බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව යම් දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් සහ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත අරමුදල් වෙන් කළ හැකි ය.

(2) එකී බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම එකී දෙපාර්තමේන්තුවේ, පළාත් සභාවේ, පළාත් අමාත්‍යාංශයේ සහ දෙපාර්තමේන්තුවේ, පළාත් පාලන ආයතනයේ හෝ රාජ්‍ය සංස්ථාවේ වගකීම විය යුතු අතර ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම සඳහා ගිණුම් ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අරමුදල් වෙන්කර ඇති යම් දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් සහ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත අරමුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරක් ඉදිරිපත් කිරීම සඳහා නියම කිරීමට සංස්ථාව වෙත හිමිකම තිබිය යුතු අතර එවැනි යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම එම දෙපාර්තමේන්තුවේ, පළාත් සභාවේ, පළාත් අමාත්‍යාංශයේ සහ දෙපාර්තමේන්තුවේ, පළාත් පාලන ආයතනයේ හෝ රාජ්‍ය සංස්ථාවේ වගකීම විය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

**25.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අරමුදලින් යම් මුදල් ආපසු ගැනීමට අදාළ රීති සෑදීම සඳහා සංස්ථාවට බලය තිබිය යුතු අතර එකී රීතින්ට අනුකූලව මිස අරමුදලින් මුදල් ආපසු ගැනීම සිදු නොකළ යුතු ය.

## VI වන කොටස

### සාමාන්‍ය

**ඉඩම් හෝ එහි සම්බන්ධතා අත්කර ගැනීම.**

**26.** (1) ප්‍රදේශය තුළ යම් ඉඩමක් හෝ යම් ඉඩමක් පිළිබඳ යම් සම්බන්ධතාවක් සංස්ථාව වෙත එහි යම් කාර්යයක් සඳහා අවශ්‍ය කරනු ලබන විට සහ අමාත්‍යවරයා විසින් යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අනුමත කරනු ලබන අවස්ථාවක දී, එම ඉඩම හෝ එම ඉඩම පිළිබඳ සම්බන්ධතාව මහජන කාර්යයක් සඳහා අවශ්‍ය බවට සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබීම සහ සංස්ථාව වෙත පැවරීම කළ හැකි ය.

(2) මේ පනත යටතේ යම් ආර්ථික සංවර්ධන කලාපයක් පිහිටුවීමේ කාර්ය සඳහා අවශ්‍ය වන්නාවූ ඉඩම හෝ ඒ පිළිබඳ සම්බන්ධතාව මහජන කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ප්‍රදේශය තුළ යම් ඉඩමක් හෝ යම් ඉඩමක් පිළිබඳ සම්බන්ධතාවක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ සංස්ථාවේ යම් කාර්යයක් සඳහා අත්කර ගනු ලබන විට එම පනත මගින් නියම කර ඇති පරිදි එකී ඉඩම හෝ ඉඩම පිළිබඳ සම්බන්ධතාව අත්කර ගැනීම සඳහා වන අදහස පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම මේ පනත ආරම්භ වන දින සිට වසර තුනක කාලසීමාවක් තුළ යම් ඕනෑම අවස්ථාවක දී පළ කරනු ලැබූ විට එම පනතේ ඊට පටහැනිව කුමක් සඳහන්වුව ද, එම ඉඩම හෝ ඒ පිළිබඳ සම්බන්ධතාව සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කිරීමේ කාර්ය සඳහා පහත විධිවිධාන අදාළ කරගත යුතු ය:—

(අ) ඉඩමේ වෙළෙඳපොළ අගය, එම නියමය කරනු ලබන දිනයේ දී එම ඉඩම පවරා ගන්නා අවස්ථාවේ දී තිබෙන තත්ත්වයෙන් ම තිබුණේ නම් එකී ඉඩමට තිබූ වෙළෙඳපොළ අගය ලෙස සලකනු ලැබිය යුතු අතර එය එම දිනයෙන් පසු එම ඉඩමට සද්භාවයෙන් සිදු කරන ලද යම් වැඩි දියුණු කිරීම් සැලකිල්ලට ගෙන සාධාරණ මුදලකින් වැඩි විය යුතු ය;

(ආ) එකී නියමය කරනු ලබන දිනයට ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම තීරණය කිරීමේ දී, මේ පනත ප්‍රකාරව සංස්ථාවේ යම් සංවර්ධන කටයුත්තක් හෝ වෙනත් මෙහෙයුමකින් උපචිත විය හැකි යම් ප්‍රතිලාභයක් හෝ වටිනාකම වැඩි වීමක් හෝ ඍජුවම හෝ අන්‍යාකාරයෙන්

උපචිත විය හැකි යම් ප්‍රතිලාභ අපේක්ෂාවක් හෝ වටිනාකම වැඩිවීමක් ගණනය කරනු නොලැබිය යුතු ය.

**සංස්ථාව වෙත පවරනු ලැබිය යුතු ඉඩම්.**

**27.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැවරී ඇති ප්‍රදේශයේ පිහිටි ඉඩම්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සංස්ථාව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එකී ඉඩම් සංස්ථාව වෙත පැවරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.

**තීරුබදු යනාදියෙන් නිදහස් කිරීම.**

**28.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ලිඛිත නීතියක විධිවිධානයන්ට යටත්ව සංස්ථාව විසින් බැඳුම්කරයක් මගින් ආනයනය කළ හෝ මිලදී ගනු ලැබූ ඕනෑම විස්තරයක සියලු භාණ්ඩ, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා එම නිදහස් කිරීම අනුමත කරනු ලබන්නේ නම් එම භාණ්ඩ තීරුබදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් ලබාගන්නා ණය මුදල්.**

**29.** (1) රජය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත, රජය විසින්, අමාත්‍යවරයා විසින් අනුමත කළ යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් සංස්ථාව විසින් ලබාගන්නා ලද ණය මුදල් සම්බන්ධයෙන් ඇප විය හැකි ය. මේ උපවගන්තිය යටතේ ඇපවීමට බලය දී ඇති ණය මුදල් විදේශ ව්‍යවහාර මුදලින් නම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබා දෙනු ලබන යම් ඇපයක් යටතේ රජය විසින් ගෙවිය යුතු සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු ය.

(3) එවැනි යම් ණය මුදලක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් ගෙවිය යුතු සියලු මුදල්, යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද-

(අ) යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පනවන ලද යම් බදු, තීරු බදු හෝ ගාස්තු අඩු කිරීමෙන් තොරව සහ එවැනි යම් බදු, තීරුබදු හෝ ගාස්තුවලින් නිදහස්ව; සහ

(ආ) යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පනවන ලද සියලු සීමාකිරීම්වලින් නිදහස්ව

ගෙවනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ශ්‍රී ලංකාවෙහි නේවාසික යම් තැනැත්තකු විසින් යම් බැඳුම්කරයක් හෝ පොරොන්දු නෝට්ටුවක් අර්ථලාභී ලෙස හිමිකාරත්වය දරන අවස්ථාවක, යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් හැර එම බැඳුම්කරය හෝ පොරොන්දු නෝට්ටුව දරන්නකුට එම බැඳුම්කරය හෝ පොරොන්දු නෝට්ටුව යටතේ සිදු කරනු ලබන ගෙවීම් මත ඇති යම් බදු, තීරුබදු, ගාස්තු හෝ සීමා කිරීම් සම්බන්ධයෙන් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙහි නේවාසිකයකු ද නැද්ද යන ප්‍රශ්නය 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) මේ පනත ප්‍රකාර රජය සහ යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර ඇති කරගත් සෑම ඇප ගිවිසුමක් ම සහ එවැනි යම් ඇප ගිවිසුමක් ප්‍රකාර රජය විසින් ලබා දෙනු ලබන සෑම ඇපයක් ම, යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒවායේ ඇති අදාළ නියම සහ කොන්දේසිවලට අනුකූලව වලංගු සහ බලාත්මක විය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් අනුමත කළ යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් විසින් සංස්ථාවට ලබා දෙනු ලැබූ රජය විසින් ඇප වූ යම් ණය මුදලක් සම්බන්ධයෙන් වන විට, එම ණය මුදල ප්‍රකාශ කරනු ලැබූ ව්‍යවහාර මුදලට හෝ ව්‍යවහාර මුදල්වලට අදාළව රුපියලේ සිදුවන යම් අගය වෙනස් වීමක් හේතුවෙන් ඇතිවන යම් අලාභයක් රජය විසින් දරාගනු ලැබිය යුතු අතර යම් ලාභයකට හිමිකම් ලැබිය යුතු ය. එවැනි සෑම අලාභයක් ම ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

(7) අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට ස්වකීය අත්සන යටතේ වූ සාධන පත්‍රයක් මගින්, රජය සහ යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර වන යම් ඇප ගිවිසුමකට, රජය වෙනුවෙන් අත්සන් කිරීම සඳහා මෙයින් බලය පවරා දෙනු ලැබේ.

**මූල්‍ය දිරිගැන්වීම් සහ වෙනත් නිදහස් කිරීම් නියම කළ යුතු බව.**

**30.** අමාත්‍යවරයා විසින් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ලිඛිත නීතියට අනුකූලව යම් වර්ගීකරණයකට අයත් ආයෝජකයකු වෙත පවතින මූල්‍ය දිරිගැන්වීම් සහ වෙනත් නිදහස් කිරීම් සහ ඉල්ලුම් කරනු ලබන ආකාරය සහ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම යන කාරණා සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි ය.

**සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පැවරීම.**

**31.** (1) ලිඛිතව නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, සංස්ථාව විසින්, මේ පනත යටතේ වන ස්වකීය බලතල, කර්තව්‍ය හෝ කාර්යය කිසිවක් සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ ප්‍රධාන විධායක නිලධරයාට පවරනු ලැබිය හැකි අතර මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව, එම සභාපතිවරයා හෝ සාමාජිකයා හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් එම බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම සිදු කළ යුතු ය.

(2) (1)වන උපවගන්තිය යටතේ සිදු කළ යම් බලය පැවරීමක් නොතකා සංස්ථාව විසින් එසේ පවරන ලද බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

**අමාත්‍යවරයාගේ විධාන.**

**32.** අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ වන බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සම්බන්ධයෙන් කලින් කල යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර එම විධානවලට අනුකූලව කටයුතු කිරීම මණ්ඩලයේ කාර්යය විය යුත්තේ ය.

**සංස්ථාවේ විධාන.**

**33.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය යැයි සංස්ථාව විසින් සලකනු ලබන විට දී, සංස්ථාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, නම් කරනු ලැබූ ආර්ථික සංවර්ධන කලාපවලට අදාළව සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියකට, සැලැස්මකට, වැඩසටහනකට හෝ යෝජනා ක්‍රමයකට අදාළ යම් කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීම හෝ කිරීම සඳහා යම් දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවකට නියම කරමින් එම දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව වෙත විශේෂ හෝ සාමාන්‍ය විධාන ලබාදිය හැකි ය.

(2) එම විධානවලට අනුකූලව කටයුතු කිරීම එම දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ කාර්යය විය යුත්තේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් විධානයක් ලබාදෙනු ලැබුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත ද, එම දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව, එම විධානය සම්බන්ධයෙන් වන සියලු කාරණාවලට අදාළව සංස්ථාවේ අධීක්ෂණයට හා පාලනයට යටත් විය යුතු ය.

**34.** ස්වකීය බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා, සංස්ථාව විසින්, අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් සහ දෙපාර්තමේන්තුවක් සහ පළාත් පාලන ආයතනයක් සහ බද්ධ ව්‍යාපාර ඇතුළු පෞද්ගලික හෝ රජයේ වෙනත් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල සමඟ සැලසුම් සකස් කිරීම හෝ ගිවිසුම්වලට එළඹීම සිදු කරනු ලැබිය හැකි ය.

සැලසුම් සහ ගිවිසුම්.

**35.** සංස්ථාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ස්වකීය මුද්‍රාව යටතේ වන ලියවිල්ලක් මගින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක් තුළ සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් පොදුවේ හෝ යම් නිශ්චිත කාරණයක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා යම් තැනැත්තකුට බලය පවරා දෙනු ලැබිය හැකි ය.

සංස්ථාව වෙනුවෙන් කටයුතු කිරීම.

**36.** මණ්ඩලයේ සියලු සාමාජිකයන්, සංස්ථාවේ සියලු නිලධරයන්, සේවකයන් සහ නියෝජිතයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සියලු සාමාජිකයන් යනාදීන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**37.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**38.** (1) යම් අධිකරණයක් ඉදිරියෙහි සංස්ථාව විසින් හෝ සංස්ථාවට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සංස්ථාව විසින් දරන ලද සියලු වියදම් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී සංස්ථාවට ගෙවන ලද හෝ සංස්ථාව විසින් අය කරගත් යම් ගාස්තුවක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

වියදම් අරමුදලෙන් ගෙවිය යුතු බව.

(2) මේ පනත යටතේ මණ්ඩලයේ යම් සාමජිකයකු, සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා හෝ යම් සේවා නියුක්තයකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි එකී තැනැත්තා විසින් හෝ එකී තැනැත්තාට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එකී තැනැත්තා විසින් දරන ලද යම් වියදම්, එම ක්‍රියාව සද්භාවයෙන් කර ඇති බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් එම වියදම් අය කරගෙන ඇත්නම් මිස, අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

**39.** (1) අමාත්‍යවරයා විසින්, සංස්ථාව විමසා නියම කරනු ලැබිය යුතු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

(2) විශේෂයෙන්ම සහ (1) වන උපවගන්තිය මගින් අමාත්‍යවරයා වෙත පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) එක් එක් නම් කරනු ලැබූ ආර්ථික සංවර්ධන කලාපය සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කරන්නන් සඳහා බලපත්‍ර දිය යුතු ආකාරය;

(ආ) ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කරන්නන්ගේ සහ මෙහෙයුම්කරුවන්ගේ සුදුසුකම්;

(ඇ) බලපත්‍රයක නියම සහ කොන්දේසි;

(ඈ) නම් කරනු ලැබූ ආර්ථික සංවර්ධන කලාපයක් තුළ ඇති පහසුකම්;

(ඉ) නම් කරනු ලැබූ ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කරන්නකුගේ සහ මෙහෙයුම්කරුවකුගේ අයිතිවාසිකම් සහ වගකීම්;

(ඊ) නම් කරනු ලැබූ ආර්ථික සංවර්ධන කලාපයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා බලපත්‍රලත් ව්‍යවසායයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්;

(උ) නම් කරනු ලැබූ ආර්ථික සංවර්ධන කලාපයක් තුළ පිහිටුවනු ලැබිය යුතු කාර්මික සහ වාණිජ සංවිධාන වර්ග;

(ඌ) ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කරන්නන් සඳහා ආර්ථික සංවර්ධන කලාප ලෙස පිහිටුවා ඇති පවත්නා ඉඩම් ප්‍රදේශ හඳුනාගැනීම, සිතියම් ගත කිරීම සහ අවශ්‍යවිට දී එම ඉඩම් ප්‍රදේශ මිල දී ලබා ගැනීමට අදාළ යම් කරුණු; සහ

(එ) පොදුවේ නම් කරනු ලැබූ ආර්ථික සංවර්ධන කලාප සංවර්ධනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමේ කාර්යය සඳහා.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එය පළ කරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලසීමාවක් තුළ පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති.

**40.** (1) රීති සාදනු ලැබීමට නියම කරන ලද හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් සංස්ථාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) සංස්ථාව විසින් සාදන ලද සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එය පළ කරන ලද දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

අර්ථ නිරූපණය.

**41.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"සංවර්ධන ව්‍යාපෘතිය" යන්නෙන්, ප්‍රදේශයේ නිෂ්පාදනය, ආදායම, සේවා නියුක්තිය උත්පාදනය කරන්නා වූ හෝ ආර්ථික, සමාජයීය හෝ පාරිසරික තත්ත්ව වැඩි දියුණු කරන්නා වූ හෝ රජයේ හෝ පෞද්ගලික යම් කටයුත්තක් අදහස් වේ;

"පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තාව" යන්නට, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඊට එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූපී හෝ ඊට සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ ඇති කරනු ලැබූ සහ පිහිටුවනු ලැබූ යම් ආයතනයක් ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**42.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.